01

233261 NATIONAL LIBRARY OF SRI LANKA 27/06/2023 13:01:17

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 684/9 — 1991 ඔක්තෝබර් 17 වැනි බ්‍රහස්පතින්දා — 1991.10.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී. — බී 19/72

1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත

1981 අංක 9 දරන පනතින් සහ 1982 අංක 16 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනතේ 3(5) සහ 10 වන වගන්ති යටතේ වරාය සහ නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඇලික් අලුවිහාරේ,
වරාය සහ නාවික කටයුතු අමාත්‍ය.

1991 ඔක්තෝබර් මස 16 වනදින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 1991 නැව් නියෝජිතයින්ට (බලපත්‍ර දීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම පනත යටතේ නැව් නියෝජිතයකු වශයෙන් ව්‍යාපාර කටයුතු කර ගන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සෑම සමාගමක් විසින් ම, ඒ සඳහා, මෙහි පළමුවන උපලේඛනයෙහි දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලවූ අයදුම්පතක් උචිත බලධරයා වෙත ඉදිරිපත් කළ හැකිය,

3. මෙම නියෝග යටතේ බලපත්‍රයක් සඳහා අයදුම් කරන සෑම අයදුම් කරුවකු විසින් ම, අයදුම්පත සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්යය සඳහා උචිත බලධරයාට අවශ්‍ය විය හැකි සියලුම තොරතුරු එම බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. බලපත්‍රයක් සඳහා වූ සෑම අයදුම්පතක් සමගම පහත දැක්වෙන ලේඛන අමුණා තිබිය යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවේ නියෝජිතයා වශයෙන් අයදුම්කරු පත් කරමින් නැව් සමාගමක අයිතිකරුගෙන් ලත් ලිපියක් ;

(ආ) ප්‍රධානියා විසින් නිත්‍ය නැව් සේවයක් ක්‍රියාත්මක කරන අවස්ථාවක දී, නැව් නියෝජිතයා සහ නැව් සමාගම විසින් අත්සන් කරනු ලැබූ නියෝජ්‍යායතන ගිවිසුමෙහි පිටපතක් ;

(ඇ) ප්‍රධානියා විසින් නිත්‍ය නැව් සේවයක් ක්‍රියාත්මක නොකරනු ලබන අවස්ථාවක දී, නියෝජ්‍යායතන නියමයක් සඳහන් කෙරෙන ලිපියක්;

(ඈ) පහත දැක්වෙන වෙනස්කම් සිදු වුවහොත් ඒ බව අයදුම්කරු විසින් උචිත බලධරයා වෙත දැනුම් දෙනු ලබන බවට අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන පොරොන්දුවක් :—

(අ) අයදුම්කරු විසින් නියෝජනය කරනු ලබන නැව් සමාගම් වල සංඛ්‍යාව සහ සංයුතියට අදාල යම් වෙනසක්; හෝ

(ආ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනස්කමක්

5. කිසියම් සමාගමක් පහත සඳහන් අවශ්‍යතා සපුරාලයි නම් මිස, නැව් නියෝජිතයකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලැබීමට සුදුසු නොවන්නේය :—

(අ) එය 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කරනු ලැබ ඇති හෝ පිහිටුවා ලියා පදිංචි කරනු ලැබූ සමාගමක් විය යුතු ය.

(ආ) (i) එය අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක ගෙවා නිමකළ ප්‍රාග්ධනයක් සහ එසේ නිශ්චය කරනු ලබන ප්‍රමාණයක බැංකු ඇපකරයක් ඇති පොදු හෝ පුද්ගලික සමාගමක් විය යුතුය, නැතහොත්

(ii) එහි කොටස් අතුරින් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන කොටස් ප්‍රතිශතයක් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අයත් වූ ද වගකීම සීමාසහිත වූ ද පොදු හෝ පුද්ගලික සමාගමක් විය යුතුය: එසේ වුවද එම සමාගමේ කොටස් අතුරින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබූ ප්‍රතිශතයට නොවැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත්හැර ඇති පුද්ගලයින් සතුව ඇති අවස්ථාවල දී, මෙම අනුඡේදයේ කාර්යය සඳහා එම කොටස්, එම පුරවැසිභාවය අත්හැරීම ගැන නොසළකා ශ්‍රී ලංකාවේ පුරවැසියන් සතු වූ සේ සලකනු ලැබිය යුතු ය; නැතහොත්

A1-D-20279—1,460 (91/10)

NATIONAL LIBRARY OF SRI LANKA N L S L 27/06/2023 13:01:17



(iii) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබූ කොටස් ප්‍රතිශත ප්‍රමාණ ශ්‍රී ලංකිකයන් සහ විදේශිකයන් සතුව ඇත්තා වූ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත නිල ලැයිස්තු ගත පාලක සමාගමක් වන සමාගමක් සම්බන්ධයෙන් වන විට, නැව් නියෝජ්‍යායතනයේ විදේශිකයන් සතු කොටස් අයිතිය අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබූ ප්‍රමාණයට නොවැඩි වේ නම්, එම නැව් නියෝජ්‍යායතන සමාගමේ කොටස් හිමියකු වීමට පුරවැසියකු ආකාරයෙන් යටකි සමාගම සුදුසුකම් ලබන්නේ යයි සලකනු ලැබිය යුතු ය; නැතහොත්

(iv) එය 1991 මැයි මස 22 වැනි දින හෝ ඊට පෙර එහි කොටස්වලින් සියයට පනස් එකකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලාංකිකයින් සතුව පැවති සීමිත වගකීමක් සහිත පොදු සමාගමක් හෝ පුද්ගලික සමාගමක් විය යුතු ය; එසේ වුවද, එම සමාගමේ සියලුම කොටස් වලින් සියයට තිහකට නොඅඩු ප්‍රමාණයක් 1971 අංක 11 දරන ලංකා නැව් සංස්ථා පනත යටතේ සංස්ථාපිත ලංකා නැව් සංස්ථාවට හෝ වෙනත් යම් ශ්‍රී ලාංකික සමාගමකට අයත් විය යුතුය.

6. මෙම නියෝග යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සෑම සමාගමක් විසින් නිසි ව්‍යාපාරික ස්ථානයක් ශ්‍රී ලංකාවේ පිහිටුවා පවත්වා ගෙන යා යුතු ය.

7. නැව් නියෝජිතයා විසින් ඉටු කරනු ලබන සියලුම සේවාවන් සඳහා ලංකා දූම්නැව් නියෝජිතයින්ගේ සංගමය විසින් නිර්දේශ කරනු ලැබුවා වූ ද විනිමය පාලක විසින් අනුමත කරනු ලැබුවා වූ ද ගාස්තු ක්‍රමය ප්‍රකාරව යම් ගාස්තුවක් ප්‍රධානයාගෙන් අය කළ යුතු ය.

8. (1) පොදු හෝ පුද්ගලික සමාගමක් වෙනුවෙන් බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රුපියල් පන්දහසක් විය යුතු ය.

(2) බලපත්‍රයක් සඳහා වූ සෑම අයදුම්පතක් සමගම රුපියල් පන්දහසක ගාස්තුවක් ගෙවිය යුතු ය. බලපත්‍රයක් සඳහා වූ අයදුම්පතක් ප්‍රතික්ෂේප කරනු ලබන සෑම අවස්ථාවක දී ම එම ගාස්තුව ආපසු ගෙවනු ලැබේ.

(3) පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණය, ඒ ගාස්තුවට අදාළව දක්වා ඇති කාරණය සම්බන්ධයෙන් බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු ය :—

(අ) නියෝජ්‍යායතනයක් පවරනු ලැබීමෙන් පසුව බලපත්‍රයක ප්‍රධානයකු ඇතුළත් කිරීම සඳහා රුපියල් එක් දහසක්;

(ආ) බලපත්‍රයක, ප්‍රධානයකු ඇතුළත් කිරීම සඳහා රුපියල් දෙසියයක් ;

(ඇ) බලපත්‍රයෙහි නම ඇතුළත් කොට නොමැති ප්‍රධානයකුට අයත් යාත්‍රාවක් යම් විශේෂ ගමනක් සම්බන්ධයෙන් යෙදවීම සඳහා යාත්‍රාව අනුව බලපත්‍රයක් නිකුත් කිරීමට රුපියල් එක් සියයක්.

9. (1) බලපත්‍රය දරන්නාට නියෝජනය කිරීමට බලය පැවරී ඇති නැව් සමාගමේ නම නැව් නියෝජිතයෙකු වෙත නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයකම නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතු ය ;

(2) යම් බලපත්‍රයක් දරන්නෙකුට, බලපත්‍රයෙහි නිශ්චිත වශයෙන් සඳහන් වන නැව් සමාගම හැරෙන්නට වෙනත් යම් නැව් සමාගමක් නියෝජනය කිරීමට හිමිකම් නැත.

10. (1) මෙම නියෝග යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාරව කිසියම් සමාගමක් මෙතෙක් දේශීය නියෝජිතයා වශයෙන් කටයුතු කළ නැව් සමාගමක දේශීය නැව් නියෝජ්‍යත්වයෙහි පැවරීමක් තමන් වෙත ලබා ගැනීමට වෙනත් යම් සමාගමක් අදහස් කරන අවස්ථාවක දී, එම සමාගම විසින්, එසේ නියෝජ්‍යත්වය පවරා ගැනීමට අදහස් කරන දිනට මාස තුනකට නොඅඩු කාලයකට ප්‍රථමයෙන් ඒ සඳහා අයදුම්පතක් උචිත බල ධාරියා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය :

එසේ වුව ද, නියෝජ්‍යත්වය පැවරීමට අදහස් කරන දිනට මාස තුනකට නොඅඩු කාලයකට ප්‍රථමයෙන් එම අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය යන අවශ්‍යතාව අතිවිශේෂ පරිවේෂණ යටතේ දී සහ ජාතික යහපත උදෙසා උචිත බලධරයා විසින් අත්හරිනු ලැබිය හැකිය.

(2) නියෝජ්‍යායතනයක් පැවරීම සඳහා වූ සෑම අයදුම්පතක් සමගම පැවරීමේ ගාස්තුව වශයෙන් රුපියල් එක්දහසක මුදලක් සහ පහත දැක්වෙන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :—

(අ) අයදුම්කරු ශ්‍රී ලංකාවේ තම නියෝජිතයා වශයෙන් පත් කරමින් නැව් සමාගමක අයිතිකරු විසින් දෙන ලද ලිපියක් ;

(ආ) ප්‍රධානියා විසින් නිත්‍ය නැව් සේවයක් පවත්වාගෙනයනු ලබන අවස්ථාව කදී, නැව් නියෝජිතයා සහ එම නැව් සමාගම විසින් අත්සන් කරගනු ලැබූ නියෝජ්‍යායතන ගිවිසුමේ පිටපතක් ;

(ඇ) ප්‍රධානියා විසින් නිත්‍ය නැව් සේවයක් පවත්වා ගෙන යනු නොලබන අවස්ථාවක දී නියෝජ්‍යාතන නියමයන් පෙන්නුම් කරන ලිපියක්;

11. (1) යම් රාජ්‍යයක ජාතික නීති හෝ සම්ප්‍රදායන්ට අනුකූල වූ විදේශීය නැව් සමාගම්වල දේශීය නියෝජිතයා වශයෙන් ඒ රාජ්‍යයේ යම් රාජ්‍ය සංවිධානයක් ක්‍රියා කරන අවස්ථාවල දී, ලංකා නැව් සංස්ථාව, එවැනි රාජ්‍යයක නැව් සමාගමක දේශීය නියෝජිතයා විය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයේ කුමක් සඳහන්ව ඇත් ද, යම් සමාගමක මුල් කොටස් ප්‍රමාණයෙන් සියයට 30 කට නොඅඩු ප්‍රමාණයක් ලංකා නැව් සංස්ථාව විසින් හෝ ලංකා නැව් සංස්ථාවේ අනුප්‍රාප්තිකයකු විසින් දරනු ලබන අවස්ථාවකදී, යට කී අන්දමේ නැව් සමාගමක දේශීය නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා බලපත්‍රයක් ඉහත සඳහන් අන්දමේ සමාගමකට උචිත බලධරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

12. කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ අත්හිටවනු ලැබුවහොත් මිස, සෑම බලපත්‍රයක් ම, එය නිකුත් කරනු ලැබ ඇති වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දින දී අවසන් විය යුතු ය.

13. (1) මේ නියෝග යටතේ බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම අයදුම්පතක් ම, මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය ;

(2) නැව් නියෝජිතයෙකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම සඳහා මේ නියෝග යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මෙහි දෙවන උප ලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය.

(3) කිසියම් වර්ෂයක් වෙනුවෙන් බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම අයදුම්පතක්ම, පූර්ව වර්ෂයේ නොවැම්බර් මස තිස් වැනි දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය.

14. 1972 ඔක්තෝබර් 3 වැනි දින අංක 27/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබුවා වූ ද කලින් කල සංශෝධනය කරනු ලැබුවා වූ ද 1972 නැව් නියෝජිතයින්ට (බලපත්‍ර දීමේ) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2 වන සහ 13(1) වන නියෝග)

## පළමුවන උපලේඛනය

### නැව් නියෝජිතයෙකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙනයාම් පිණිස බලපත්‍රයක්/බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ අයදුම්පත් ආකෘතිය

1. අයදුම්කරුගේ නම :————.
2. ලියාපදිංචි ලිපිනය :————.
3. සමාගම් ආඥාපනත/1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචිය :————. දිනය :————.
4. ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ලිපිනය :————. දුරකථන අංකය :————. ටෙලෙක්ස් අංකය :————.
5. පුද්ගලික සමාගමක් ද නැතහොත් පොදු සමාගමක්ද යන වග සඳහන් කරන්න :————.
6. විදේශීය සමාගම්වල කොටස් අයිතිය පිළිබඳ විස්තර :————.

NATIONAL LIBRARY OF SRI LANKA N L S L 27/06/2023 13:01:17
233261



7. ව්‍යාපාරයේ ස්වභාවය සඳහන් කරන්න :————.

8. ගෙවා නිමි ප්‍රාග්ධනය :————.

9. බැංකු ඇපකරය පිළිබඳ විස්තර :————.

10. නැව් නියෝජිතයෙකු වශයෙන් හැර අයදුම්කරු විසින් කරගෙන යනු ලබන වෙනත් ව්‍යාපාර කටයුතු —— ——.

11. අධ්‍යක්ෂවරුන්ගේ නම්, ලිපිනයන් සහ ජාතිය සඳහන් කරන්න:—— –

12. (අ) අයදුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ නිත්‍ය නැව්සේවා ක්‍රියාත්මක කරන යම් නැව්හිමියෙකු හෝ ප්‍රධානයකු හෝ නැව් කුලියටගන්නෙකු හෝ නෞකාධිපතියකු හෝ වෙනුවෙන් ද ඔහු පිළිබඳ විස්තර :————.

(ප්‍රධානියා නැව් හිමියා ද නැව් කුලියට ගන්නා ද නැතහොත් නෞකාධිපතියා ද යන වග සඳහන් කරන්න)

| අයිතිකරුගේ, ප්‍රධානියාගේ කුලියට ගන්නාගේ හෝ නෞකාධිපතිගේ නම | ලිපිනය | නැව්මාර්ග |
|---|---|---|

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන්නේ නැව් සමාගම් නොවන නැව්සේවා ක්‍රියාත්මක කරන යම් නැව්හිමියෙකු හෝ ප්‍රධානියෙකු හෝ නැව් කුළියට ගන්නෙකු හෝ නෞකාධිපතියෙකු හෝ වෙනුවෙන් ද ඔහු පිළිබඳ විස්තර:— (ප්‍රධානියා නැව්හිමියාද, නැව් කුළියටගන්නා ද, නෞකාධිපති ද යන වග සඳහන් කරන්න)

| නැව්හිමියාගේ, ප්‍රධානයාගේ නැව් කුලියටගත් තැනැත්තාගේ හෝ නෞකාධිපතිගේ නම | ලිපිනය |
|---|---|

13. කලින් බලපත්‍රය පිළිබඳ විස්තර :——— —.

අංක :————. වර්ෂය :——— ——.

14. අයදුම්කරු විසින් නියෝජනය කරනු ලබන නැව් සමාගම් විසින් පසුගිය වසර තුන තුළදී ශ්‍රී ලංකාවේ දී පටවනලද හා බානලද නැව්බඩු ප්‍රමාණය (එක් එක් වර්ෂය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් සංඛ්‍යා ලේඛණ දක්වන්න) :————.

15. මෙම අයදුම්පතෙහි ඇතුලත් සියළුම ප්‍රකාශයන් අපේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අපි ප්‍රකාශ කරමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනස්කම් ගැන දැනුම්දීමට අපි පොරොන්දු වෙමු.

අධ්‍යක්ෂවරුන්ගේ නම සහ අත්සන් :—

දිනය :————.

(13(2) වන නියෝගය)

දෙවන උපලේඛනය

නැව් නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා බලපත්‍රය

වර්ෂය :—, .——.

අංකය :————.

(1981 අංක 9 දරන පනතින් සහ 1982 අංක 16 දරන පනතින් සංශෝධිත 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍රදීමේ පනත යටතේ නිකුත් කරන ලදී)

පහත විස්තරකොට ඇති අයිතිකරු හෝ ප්‍රධානියා හෝ කුලියටගන්නා හෝ නෞකාධිපති වෙනුවෙන් පමණක් ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයන්, වශයෙන් කටයුතු කරගෙන යාමට ................................... සීමාසහිත .......................... ට මින් බලය දෙනු ලැබේ. මේ බලපත්‍රය ........... ................................වැනි දින සිට ............................. වැනි දින දක්වා වලංගු වේ.

බලපත්‍ර ගාස්තුව :—————.

—————,

වෙළඳ නැව් අධ්‍යක්ෂ,

නිකුත් කළ දිනය :—————.

වැදගත්

1. මෙම බලපත්‍රය අන්සතු කළ නොහැක.

11–59